# ශ්‍රී ලංකාවේ අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කළුබෝවිටියන සෝරත හිමි

## Abstract

'Inclusive education' can be defined as a concept that protects the right to equal education through a human rights approach. 'Inclusive education' approach, is a strategy to achieve the goal of education for all. This is a new trend in global education in the 21st century. Sri Lanka has entered into global conventions on the equal right of every child to education as well as the compulsory provision of primary education. The purpose of this research is to study how integrated education works in the school system in Sri Lanka. It is also focused on identifying problems and proposing solutions. Research-related findings were presented by analyzing quantitative and qualitative data through a mixed research methodology. Four schools with a special unit implementing inclusive education in the udunuwara Education Zone in Kandy District were selected as the sample. Preliminary and secondary data were obtained by conducting interviews with education administrative officers, principals

and deputy principals, teachers in special unit, teachers in general classrooms and parents providing questionnaires and monitoring the school environment and the overall community. 8.7% of the total population of Sri Lanka suffers from any form of disability, and inclusive education is required to provide educational opportunities under compulsory education without segregating them from the society. Identifying the special needs children is a key step of inclusive. Second step is to include them into special education, then integration into the general classroom are some of the steps that work in inclusive education. In some cases, referrals are made first in the general classroom, and special needs are identified in the learning-teaching process and referred to a special unit, and in some cases, the specialist teacher summon to the general classroom. This process is taking place in some school system in Sri Lanka while there are some weaknesses in other schools when taking place this process. Lack of wareness of stakeholders and the school community about education, lack of positive and positive attitudes, lack of vocational training, lack of support from ordinary classroom teachers, special unit teacher or specialist, lack of integration of Educational authorities: Inadequate intervention, curriculum coverage and the existence of a competitive examination system and lack of professional satisfaction are some of the problems and challenges that arise in the implementation of inclusive education. This research studies how the whole process of Inclusive Education take place in Sri Lanka and the problems related to this process. The education system of Sri Lanka need further development so that to the each and every child can enter to the general classrooms.

**Key Words :** Children with Special Needs; Inclusive Education; Intergration Education; Special Education



## සාරසංක්ෂේපය

මානව අයිතිවාසිකම් ප්‍රවේශයකින් සම අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කරන සංකල්පයක් ලෙස අන්තර්කරණ අධ්‍යාපනය හඳුන්වයි. අන්තර්කරණ අධ්‍යාපන ප්‍රවේශය සැමට අධ්‍යාපන ඉලක්කය සාක්ෂාත් කර ගැනීමේ උපාය මාර්ගයකි. 21 වන සියවසේ ගෝලීය අධ්‍යාපනයේ නව ප්‍රවණතාවකි. සෑම දරුවෙකුටම අධ්‍යාපනය ලැබීමට සමාන අයිතියක් මෙන්ම ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්යෙන් ලබාදීම පිළිබඳ ගෝලීය සම්මුතිවලට ශ්‍රී ලංකාව එළඹියේය. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක වන ආකාරය අධ්‍යයනය කිරීමය. එහිදී ගැටලු හඳුනාගැනීම සහ විසඳුම් යෝජනා කිරීම කෙරෙහිද අවධානය යොමු කොට අනාවරණයන් ඉදිරිපත් කරන ලදි. මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර අධ්‍යාපන කලාපයේ අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක කරන විශේෂ ඒකකයක් සහිත පාසල් 4ක් නියැදිය ලෙස තෝරාගන්නා ලදි. අධ්‍යාපන පරිපාලන නිලධාරීන්, විදුහල්පතිවරුන් හා නියෝජ්‍ය විදුහල්පතිවරුන්, විශේෂ ඒකකභාර ගුරුවරුන්, දෙමව්පියන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන්ද ප්‍රශ්නාවලි ලබාදීමෙන් හා පාසල් පරිසරය සහ සමස්ත ප්‍රජාව නිරීක්ෂණයෙන් ප්‍රාථමික හා ද්විතීයික දත්ත ලබාගන්නා ලදි. ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 8.7%ක් කුමන හෝ ආබාධයකින් පෙළෙන අතර ඔවුන් සමාජයෙන් වෙන් නොකර, අනිවාර්ය අධ්‍යාපන නියෝග යටතේ අධ්‍යාපන අවස්ථා ලබාදීමට අන්තර්කරණ අධ්‍යාපනය අවශ්‍ය වේ.විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හඳුනාගැනීම අන්තර්කරණයේ මූලික පියවරකි. පසුව විශේෂ අධ්‍යාපනයට යොමු කිරීම, සාමාන්‍ය පන්තිකාමරයට ඒකීයකරණය කිරීම අන්තර්කරණයේ ක්‍රියාත්මක වන පියවර කිහිපයකි. ඇතැම් අවස්ථාවල සාමාන්‍ය පංතිකාමරයට මුලින් යොමුකොට, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ විශේෂ අවශ්‍යතා හඳුනාගෙන විශේෂ ඒකකයට යොමු කිරීමද විශේෂඥ ගුරුවරයාගේ සහයෝගය ලබාගැනීමද සිදුකරයි. ලංකාවේ පාසල් පද්ධතියේද එම ක්‍රියාවලිය සිදුවන අතර ඇතැම් පාසල්වල දුර්වලතා රැසක් හඳුනාගැනිණි. අන්තර්කරණය අධ්‍යාපනය පාර්ශ්වකරුවන්ගේ සහ පාසල් ප්‍රජාවගේ දැනුවත්භාවය නොමැති වීම, ධනාත්මක සහ ප්‍රතිජනනාත්මක ආකල්ප නොමැති වීම, පාසල්වල භෞතික හා මානව සම්පත් හිඟය,

වෘත්තීය පුහුණුව නොමැතිවීම, අධ්‍යාපන බලධාරීන් ප්‍රමාණවත් පරිදි මැදිහත්වීමක් සිදු නොකිරීම, විෂයමාලා ආවරණය සහ තරගකාරී විභාග ක්‍රමයක් පැවතීම සහ වෘත්තීය තෘප්තිමත්භාවය නොමැති බව හේතු සාධක ගැටලු ලෙස හඳුනාගන්නා ලදි සෑම දරුවෙකුටම අපහසුතාවකින් තොරව සාමාන්‍ය පංතිකාමරයට ඇතුළත් වීම සඳහා ශ්‍රී ලාංකේය පාසල් පද්ධතිය තවදුරටත් සංවර්ධනය විය යුතුය.

යතුරු පද: අන්තර්කරණ, ඒකීකරණ අධ්‍යාපනය, විශේෂ අධ්‍යාපනය, විශේෂ අවශ්‍යතා සහිත දරුවන්,

## ප්‍රවේශය

අධ්‍යාපනය නැමැති ප්‍රාග්ධනයෙන් තොරව ලෝකයේ සංවර්ධනයක් සිදු නොවේ. මානව ප්‍රජාවගේ පැවැත්ම සහ සංවර්ධනය තීරණය වන්නේ අධ්‍යාපනය මතය. අධ්‍යාපනික වශයෙන් සංවර්ධනය නොවූ සමාජ කණ්ඩායමක ගෝත්‍රික වූ ලක්ෂණ පෙන්නුම් කරයි. සමාජයක යහපැවැත්ම උදෙසා හේතු වන්නේ අධ්‍යාපනික වශයෙන් ඉහළ තලයේ සිටින මානව සම්පතයි. එබැවින් 20 වැනි සියවසේ අධ්‍යාපනය කෙරෙහි සුවිශේෂ අවධානයක් යොමු විය. අධ්‍යාපනය ලැබීම මානව අයිතිවාසිකමක් සහ ළමා අයිතිවාසිකමක් වශයෙන් ගෝලීයව පිළිගෙන සම්මුති ප්‍රකාශනවලට එළඹී ඇත. එම සම්මුති සහ ප්‍රකාශන ගෝලීය නව අධ්‍යාපන ප්‍රවණතා රැසකට ප්‍රවේශ සපයයි. නව ප්‍රවණතා සහ එළඹුම්වල ප්‍රතිඵලය වූයේ අධ්‍යාපනය නව දිශාවකට යොමු වීමයි.

විවිධ කායික, මානසික ආබාධ සහ නොහැකියා මත පදනම්ව අධ්‍යාපනය ලැබීමේ අයිතියෙන් වියුක්ත වූ, එමෙන්ම සම අධ්‍යාපන අයිතීන් ලැබීමෙන් තොර වූ, ශිෂ්‍යයන් කෙරෙහි අවධානය යොමු වූයේ සෑමට අධ්‍යාපන සංකල්පය සමාජයේ මුල් බැස ගැනීමත් සමගය. ආරම්භක අවධියේදී ඔවුන් සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියෙන් වෙන්කොට විශේෂිත අධ්‍යාපන ක්‍රමවේදයන් ඔස්සේද, පශ්චාත් කාලීනව සාමාන්‍ය පාසල තුළ ඇති විශේෂ අධ්‍යාපන ඒකකයට යොමු කරමින් විශේෂඥ ගුරුවරුන්ගේ සහාය ලබා ගනිමින් ඔවුන් සාමාන්‍ය පාසල් පද්ධතියට ඒකීකරණය (සාමාන්‍යකරණය) කිරීමද සිදුවිණි. සෑමට අධ්‍යාපන සංකල්පයෙන් (Education For All) බිහිවූ අදහස්



හා යෝජනාවල දිගුවක් ලෙස අන්තර්කරණ අධ්‍යාපනය සංකල්පය බිහිවිය. ශ්‍රී ලංකාව ඇතුළු රාජ්‍යයන් 92ක් සහ ස්වේච්ඡා සංවිධාන 25ක සහභාගිත්වයෙන් එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (UNESCO) විසින් 1994දී iamd[a[fha සලමන්කා අගනුවරදී මෙම ප්‍රකාශය එළිදක්වමින් අන්තර්කරණ අධ්‍යාපන සංකල්පය ඉදිරිපත් කරන ලදි.

එක් එක් ශිෂ්‍යයාගේ පෞද්ගලික අවශ්‍යතාවන් සුරක්ෂිත කරමින් ඔවුන්ට යෝග්‍ය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම අන්තර්කරණයයි. ගෝලීය අධ්‍යාපන පද්ධතියේ නව ප්‍රවණතාවකි. ශිෂ්‍ය විවිධත්වයට ගරු කරමින් සාමාන්‍යපංතිකාමරය තුළ දරුවාගේ හැකියාවන් හා නොහැකියාවන් හඳුනාගෙන, එම ගැටලු නිරාකරණය කර ගැනීමට ශිෂ්‍යයාට සහාය වෙමින් ඔහුගේ සමස්ත සංවර්ධනය සඳහා විදුහල්පති, සාමාන්‍ය පාසල් ගුරුවරු, සිසුන් ප්‍රමුඛ පාසල, සමාජය සහ රජය එකමුතුව ගොඩනගන යහපත් සමාජ පරිසරය අන්තර්කරණයයි. කුමන අභියෝග තිබුණත් සියලුම සිසුන්ට ඔවුන්ගේම අසල්වැසි පාසල්වල වයස් මට්ටමට සරිලන සාමාන්‍ය අධ්‍යාපන පන්තිවලදී සාමාන්‍ය විෂයමාලාවේ සාරය උසස් තත්වයේ උපදෙස්, මැදිහත්වීම් සහ ආධාර ඇසුරෙන් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට අවස්ථා උදාකිරීම ගෝලීය අධ්‍යාපනයේ නව ප්‍රවේශයක් බවට පත් වී ඇත.

අන්තර්කරණ අධ්‍යාපන සංකල්පය පාසල් පද්ධතියේ ක්‍රියාත්මක කිරීමේදී උද්ගත වන අභියෝග කෙරෙහි අවධානය යොමු කොට, එම අභියෝග මගහරවා ගැනීමට අවශ්‍ය ප්‍රායෝගික ප්‍රවේශයන් අනුගමනය කළ යුතු වේ. "අප ජීවත්වන වට ලෝකයේ සමහර පැතිකඩවල් ගැටලු සහගත මෙන්ම අධ්‍යයනය කිරීමට තරම් වටිනා දේවල් ද ලෙසින් තෝරා ගැනීම" පර්යේෂණ ගැටලුවක් ලෙස ජෝන් එල්රිජ් දක්වයි. ශාස්ත්‍රීය ගවේෂණයක් කිරීමට තරම් වැදගත් වන සංකල්පමය විමර්ශනයක් පිළිබඳ ගොඩනගා ගන්නා ප්‍රකාශය පර්යේෂණ ගැටලුව ලෙස උයන්ගොඩ හඳුන්වයි. එය හුදෙක් ප්‍රශ්නයක්ම නොවන අතර ශාස්ත්‍රීය ගවේෂණයකට ලක් කළ හැකි ගැටලුවකි.

මෙම පර්යේෂයට අදාළව ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක වන ආකාරය, ගැටලු

හඳුනාගැනීම සහ ඒ සඳහා විසඳුම් යෝජනා කිරීම මෙරට අධ්‍යාපන පද්ධතියේ උන්නතිය උදෙසා හේතුවන්නකි. ඒ අනුව මෙම පර්යේෂණ ගැටලුව අධ්‍යාපන ක්ෂේත්‍රයට අයත් වන අන්තර්කරණ අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව සිදුකරන ශාස්ත්‍රීය ගවේෂණයකි.

## පර්යේෂණ ගැටලුව

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමේ දී උද්ගතව ඇති ගැටලු සහ අභියෝග හඳුනාගැනීම හා අන්තර්කරණ අධ්‍යාපනය වඩා ඵලදායි ලෙස ක්‍රියාත්මක කළ හැකි ද? යන්න හඳුනාගැනීම

## පර්යේෂණයේ ප්‍රධාන අරමුණ

පර්යේෂණ ප්‍රධාන අරමුණ ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක වන ආකාරය, ගැටලු හඳුනාගැනීම සහ ඒ සඳහා විසඳුම් යෝජනා කිරීම

## පර්යේෂණයේ වැදගත්කම

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් පිළිබඳ ප්‍රකාශනයේ දී ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී සමාජයක් ගොඩනැගීමෙහිලා දක්වා ඇති රජයේ අරමුණු අතරින් එක් අරමුණක් වන්නේ "නූගත්කම මුලින්ම තුරන් කිරීම සහ සියලු තැනැත්තන්ට අධ්‍යාපනයේ සෑම අවස්ථාවක්ම සර්ව සාධාරණ හා සමාන ඉඩ ප්‍රස්තා ලබා ගැනීමේ අයිතිය සහතික කිරීම"යි. සියලුම ළමයින්ට අධ්‍යාපනය පිළිබඳ සම අවස්ථාවන් සැපයීමට ශ්‍රී ලංකා රජය බැඳී සිටියි. එවැනි වූ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය උදෙසා ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානයට යොමු විය යුතු ක්ෂේත්‍රයක් මෙම පර්යේෂණයෙන් ආවරණය කරයි. එබැවින් මෙම පර්යේෂණය රාජ්‍ය ප්‍රතිපත්ති ගොඩනැගීමෙහිලා අවධාරිත මූලාශ්‍රයක් බවට පත්වෙමින් සුවිශේෂ වටිනාකමක් පර්යේෂණයට එකතු කෙරේ..

2020 - 12 - 03 දිනැති අන්තර්කරණ අධ්‍යාපනය ලබාදීම පිළිබඳ අංක 37/2020 අධ්‍යාපන චක්‍රලේඛය හා උපදෙස් සංග්‍රහයට අනුව



එය නිකුත් කර වසර දෙකක අන්තර්කාල සීමාව ඇතුළත සියලුම ළමුන් පාසල් ගතකොට අනිවාර්ය අධ්‍යාපනය ලබාදිය යුතුය. එම චක්‍රලේඛයට අනුව 2021 - 01 - 01 දින සිට 2022 - 12 - 31 දක්වා වන අන්තර්කාලය තුළ ඒ ඒ අධ්‍යාපන කලාපවල විශේෂ අධ්‍යාපන ඒකකවල ඉගෙනුම ලබන සියලුම සිසුන් ලබා ඇති සංවර්ධනය ත්‍රිපුද්ගල කමිටුවක් මගින් තක්සේරු කොට, එම වාර්තාවේ නිර්දේශ අනුව සුදුසු සාමාන්‍ය පන්තිකාමරයකට ඇතුළත් කළ යුතුය. උක්ත චක්‍රලේඛය හා ලිපියට අදාළව අන්තර්කරණය කිරීම කාලීන අවශ්‍යතාවක් බවට පත්ව ඇත. එවැනි අධ්‍යාපනික කාර්යයක් සඵල කර ගැනීමට අන්තර්කරණය ආශ්‍රිත පර්යේෂණ සිදු කිරීම කාලීන අවශ්‍යතාවක් ඉටු කිරීමකි. ඒ සඳහා මෙම පර්යේෂණය මහත් රුකුලක් වේ.

අධ්‍යාපනය පිළිබඳ විදේශීය වශයෙන් පර්යේෂණ බොහෝ ප්‍රමාණයක් සිදුව තිබුණද දේශීයව පර්යේෂණ සිදුකොට ඇත්තේ අල්ප වශයෙනි. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව සිදුකරන ලද පර්යේෂණ විරලය. එබැවින් ඒ ගැඹුරින් පර්යේෂණ සිදු කිරීම සඳහා මෙම අධ්‍යයනය මූලික පර්යේෂණයක් වශයෙන් මහෝපකාරී වනු ඇත.

## සාහිත්‍ය විමර්ශනය

පර්යේෂණ අරමුණු සාධනය කර ගැනීම සඳහා පූර්ව සාහිත්‍යය විමර්ශනයක යෙදීමෙන් පර්යේෂණය වඩාත් ඵලදායි කර ගැනීම පර්යේෂකයාගේ අරමුණයි. දේශීය හා විදේශීය සාහිත්‍ය මූලාශ්‍රයන් ඇසුරෙන් පෙර දැනුම විවේචනාත්මකව, සංවිධානාත්මකව හා සංක්ෂිප්තව ඉදිරිපත් කෙරේ. **Furuta (2009)** විසින් සිදු කළ "Responding to Educational Needs of Children With Disabilities: Care and Education in Special Pre-School in the North Western Province of Sri Lanka. පර්යේෂණ පත්‍රයෙන් ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ විශේෂ අධ්‍යාපන පෙර පාසල්වල රැකවරණය සහ අධ්‍යාපනය පිළිබඳ අධ්‍යයනය කර ඇත. අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ අධ්‍යනයේදී මෙම සාධක පිළිබඳ පූර්ව පර්යේෂණ අධ්‍යයන පර්යේෂණ කාර්යය පහසු කරවයි.

සුනිල් (2019) විසින් රචනා කරන ලද "විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය කෘතිය"මෙම පර්යේෂණයේදී ප්‍රධාන දේශීය මූලාශ්‍රයක් ලෙස භාවිත 21 කෙරේ. පන්තිකාමර නිරීක්ෂණයෙන් හා පෙර පාසල් ගුරු මහත්ම මහත්මීන් විසින් හඳුනාගත් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇසුරෙන් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හඳුනාගැනීම සහ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා වර්ගීකරණය කරයි. මනස සෙමින් වර්ධනය වන ළමයින්, දෙඹුන් කශේරුව, ජලකපාලතාව, මානසික ගැටලු, ක්ලමථය, කාංසාව, භීතිකාව, ග්‍රස්ථිය අනිවාර්ය අක්‍රමතාවය සහ සුභග සිසුන් ආදි විවිධ වූ ආබාධවල ස්වභාවය දීර්ඝ වශයෙන් විස්තර කෙරේ.

UNESCO සංවිධානය (2005) විසින් ප්‍රකාශනය කළ" අන්තර්කරණ කිරීම සඳහා මාර්ගෝපදේශ: සැමට අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වීම සහතික කිරීම" වාර්තාව මෙම පර්යේෂණය හා සම්බන්ධ වැදගත් වාර්තාවකි. විශේෂ අධ්‍යාපනය සඳහා ඇතුළත් කිරීම, ඒකීකරණය සිට අන්තර්කරණය දක්වා යොමුවීම සහ අන්තර්කරණය සැමට අධ්‍යාපනය සංකල්පය සමග සම්බන්ධ වීම පිළිබඳ විදේශීය මූලාශ්‍රයකි. අන්තර්කරණ අධ්‍යාපනය මානව අයිතිවාසිකමක් විස්තර කෙරෙන අතර, අන්තර්කරණය නිර්වචනය කිරීම ද සමානාත්මතාවට වඩා සාධාරණත්වය මතුකරන කරන සංකල්පයක් ලෙස අන්තර්කරණය හඳුනාගැනේ.

**Hettiaarachi**, Ranaweera, Walisundara, Attanayake & Das (2018) යන අය විසින් සම්පාදිත "Including all ? Perceptions of Mainstream Teachers on Inclusive Education in the Western Province of Sri Lank", නම් පර්යේෂණයෙන් අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ ප්‍රධාන ධාරාවේ ගුරුවරුන්ගේ (සාමාන්‍ය පංතිකාමර ගුරුවරුන්ගේ) සංජානනය තේමා හතක් යටතේ දක්වයි. ශ්‍රී ලංකාවේ බස්නාහිර සාමාන්‍ය පන්තිකාමර ගුරුවරුන් 15ක් සමග සම්මුඛ සාකච්ඡා ඇසුරෙන්, මෙම අධ්‍යයනය සිදු කර ඇත. ගුරුවරුන්ට විශේෂ පුහුණුව නොමැතිකම, නිසියාකාරව අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් නොවීම සහ ප්‍රධාන වශයෙන් නොදැනුවත්භාවය ඉස්මතු කොට දක්වයි.

අතුකෝරාල **(2016)** විසින් රචනා කරන ලද "තුලනාත්මක අධ්‍යාපනය හා රට රටවල අධ්‍යාපනය" කෘතියෙහි ශ්‍රී ලංකාවේ



අධ්‍යාපන පද්ධතිය පිළිබඳ බොහෝ තොරතුරු අන්තර්ගත වේ. සංවර්ධනය වෙමින් පවතින රටවල් අවධානය යොමු කළ යුතු අධ්‍යාපන ගැටලු යටතේ සම අධ්‍යාපන අවස්ථා සැපයීම දක්වමින් සෑම ළමයෙකුටම අධ්‍යාපනයට ඇති මූලික අයිතිවාසිකම් හා අනිවාර්ය අධ්‍යාපනය පිළිබඳ කරුණු දක්වයි.

ශාස්ත්‍රීය පර්යේෂණ සාහිත්‍ය හඳුනාගැනීම මගින් මෙම පර්යේෂණ ගැටලුව,පර්යේෂණවිධික්‍රම,න්‍යායයනමේවාවඩවඩාත්දියුණුහාසුසංගත කර ගැනීම සඳහා සාහිත්‍යයේ ආලෝකය පර්යේෂකයාට ආධාර විය.

## පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණ ක්‍රමවේද යටතේ පර්යේෂණය සිදු කිරීමේදී අනුගමනය කරන ක්‍රමවේදය ලෙස මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරන ලදි.

## අනාවරණ

පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරමින් සිදුකරන පර්යේෂණයේ හරය අන්තර්ගත වේ. එය අනාවරණ ලෙසද හඳුන්වයි. අන්තර්කරණ අධ්‍යාපන ක්‍රියාත්මක කිරීමේදී විශේෂ අධ්‍යාපනය ද වැදගත් පියවරක් වන බැවින් ඒ පිළිබඳව ලබාගත් දත්ත අනාවරණය කෙරේ. මානව හා ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කරන සැමට අධ්‍යාපන සංකල්පය, විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හඳුනාගැනීම සහ විශේෂ අධ්‍යාපනය, ඒකීයකරණ අධ්‍යාපනයෙන් අන්තර්කරණ අධ්‍යාපනයට ප්‍රවිෂ්ට වීම සහ අන්තර්කරණ අධ්‍යාපනයයේ අවශ්‍යතාව හඳුනාගැනීම ආදි තේමාවන් යටතේ විග්‍රහ කෙරේ. එහිදි පර්යේෂණ දත්ත විශ්ලේෂණයෙන් පහත කරුණු ස්ඵුට විය.

වර්තමාන ශ්‍රී ලංකේය අධ්‍යාපන පද්ධතියේ විශේෂ අවශ්‍යතා සහිත ළමයින් පහත පරිදි වර්ගීකරණය කළ හැකිය.

01. බුද්ධියෙන් අඩු (මන්දබුද්ධික)

02. ඇසීම නැති හෝ අඩු (ශ්‍රවණාබාධිත)

03. විවිධ කථන දෝෂ සහිත (කථනාබාධිත)

04. පෙනීම නැති හෝ අඩු (දෘශ්‍යාබාධිත)

05. කොර ආදි ශාරීරික බාධා (ශාරීරික ආබාධ)

06 චර්යා පිළිබඳ අබාධ සහිත ළමුන්(චර්යාබාධිත)

07. සුහගළමයින්

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේදී විශේෂ අවශ්‍යතා ඇති දරුවන් අධ්‍යාපනය ලබන පාසල් වර්ග කර ඇත්තේ උපකෘත පාසල් ලෙසය. මෙම පාසල් සඳහා ගුරුවරු හා පෙළ පොත් අධ්‍යාපන අමාත්‍යංශය මගින් ලබා දුන්නද සෙසු පහසුකම් සියල්ල සපුරා ගත යුතුව ඇත්තේ රාජ්‍ය නොවන සංවිධාන හෝ වෙනත් උපකාරක අයතන මගිනි. එබැවින් තත් පාසල් පද්ධතිය ආශ්‍රිතව ගැටලු රාශියක් උද්ගතව ඇත. පාසල්වල අධ්‍යයන කටයුතු සිදු කරන ශිෂ්‍යයන් හැඳින්වීමේදී අතීතයේ භාවිත "අඳ, ගොලු, බිහිරි" යන වචන වෙනුවට වර්තමානයේ "විශේෂ අවශ්‍යතා සහිත දරුවන්" ලෙස හැඳින්වීම කෙරෙහි අවධානය යොමුව තිබේ. එකී විශේෂකරණයෙන් ද වියුක්ත වී සමාන්‍යකරණය කර, ඔවුන්ගේ අවශ්‍යතා හඳුනාගැනීම කෙරෙහි පාසල් ප්‍රජාව පෙළ යුතු බව ද 2020 වර්ෂයේ වූ 37/2020 අධ්‍යාපන චක්‍රලේඛයෙන් පෙන්වා දෙයි.

සාමාන්‍ය දරුවන් හා සමානවම විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට ද අධ්‍යාපනය ලැබීමට අයිතියක් තිබේ. ව්‍යවස්ථානුකූලව ළමුන් 02 දෙනෙක් සඳහා එක් ගුරුවරයෙක් සිටිය යුතුය. ඇතැම් පන්තිවල වැඩි සිසුන් පිරිසක් සිටින අතර, ඔවුනතුරෙන් දුර්වල හා දක්ෂ සිසුන් වශයෙන් ද දැකිය හැකි බැවින් ඇතැම් අවස්ථාවලදී ගුරුවරුන්ට සහ පරිපාලනයට ගැටලුකාරී තත්වයන්ට ද මුහුණපෑමට සිදුව ඇත.

පරිපාලන මට්ටමින් ජාතික අධ්‍යාපන ආයතනය 1988 සිට විශේෂ අධ්‍යාපනය සඳහා වෙන් කළ අංශයක් පිහිටුවන ලදී. 1991 සිට එය විශේෂ අධ්‍යාපන දෙපාර්තමේන්තුව ලෙස හඳුන්වයි. 2004 වසරේ සිට අන්තර්කරණ දෙපාර්තමේන්තුව ලෙස හැඳින්වෙන මෙම අංශය මගින් විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපන අයිතීන් සුරක්ෂිත කරලීම වෙනුවෙන් සහ ඔවුන්ට අවැසි නිසි මග පෙන්වීම, උපදේශනය හා අනාගත සංවර්ධන අරමුණු වෙනුවෙන් ඔවුන්ගේ ශ්‍රම සහභාගිත්වය ලබා ගැනීම තෙක් වන සුවිසල් කාර්යභාරයක් ඉටු කරමින් සිටියි. විශේෂ අධ්‍යාපනය සංවර්ධනය කොට වැඩි සිසුන් පිරිසක් සාමාන්‍ය පන්තිකාමරයට යොමු කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය මගින් ඉටු කරන කාර්යයන් කිහිපයක් මෙසේ දැක්විය හැකිය. චක්‍රලේඛ, අණපනත්, නීතිරෙගුලාසි සහ උපදෙස්



සංග්‍රහයන් නිකුත් වුවද වැදගත් වන්නේ සාමාන්‍ය පන්තිකාමරයේ සිදුවන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියයි. සාමාන්‍ය පංන්තිකාමරයේ සිදුකරන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙන් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් බැහැර කරන්නේ නම් අන්තර්කරණය සාර්ථක නොවේ. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සිටින සාමාන්‍ය පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී විශේෂ අධ්‍යාපනය පිළිබඳ පුහුණුවක් ලද ගුරුවරුන්ගේ සහයෝගය ලබා ගැනීම සාර්ථකව සිදු නොවේ.

අන්තර්කරණ අධ්‍යාපන සංකල්පය පාසල් පද්ධතියට හඳුන්වාදීමේදී උද්ගත වන ගැටලු කෙරෙහි අවධානය යොමු කොට එම ගැටලු මගහරවා ගැනීමට අවශ්‍ය ප්‍රවේශයන් ගත යුතු වේ. අන්තර්කරණයට ප්‍රවේශවීමේදී ඇති වන ගැටලු පහත අංශ ඔස්සේ ගොනු කළ හැකිය.

නම්‍යතාවයෙන් කටයුතු කිරීමේ ගැටලු

යෝග්‍ය සේවා සංවිධානය පිළිබඳ ගැටලු

විශේෂඥ වෘත්තීයභාවය පිළිබඳ ගැටලු

විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයින් සාමාන්‍ය පන්තිකාමරය තුළ පිළිගැනීමේ ගැටලු

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ ගුරුවරුන්ගේ ආකල්ප සතුටුදායක මට්ටමක නොපවතින බව ප්‍රශ්නාවලි ඇසුරින් ලබා ගත් දත්ත විශ්ලේෂණයෙන් පැහැදිලි විය. එහිදී විශේෂ ඒකක ගුරුවරුන්ගෙන් 100%ක් පිළිබඳ සතුටුදායක නොවන අතර ප්‍රාථමික අංශයේ සිට උසස් පෙළ අංශය දක්වා සාමාන්‍ය පන්තිකාමර ගුරුවරුන්ගෙන් 71%ක් සතුටුදායක නොවේ. දරුවා පාසලෙන් ලබන අධ්‍යාපනය අඛණ්ඩව පවත්වාගෙන යාමට නිවසින් ලැබෙන සහයෝගය ද වැදගත් වේ. අන්තර්කරණය සාර්ථක වන්නේ එවිටය. පන්තිකාමරයේදී ගුරුවරයා ලබාදෙන සහයෝගය පවත්වාගෙන යන්නේ පවුල් පසුබිම ඇසුරිනි. එබැවින් පවුල් සංස්ථාව සහ පාසල අතර මනා සන්නිවේදනය නොතිබීමේ ගැටලුව ද මෙහිදී ස්ඵුට විය.

## යෝජනා

අන්තර්කරණය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී භාවිත කළ යුතු ප්‍රවේශයන් රාශියකි. පොදු ඉගෙනුම් පරිසරයක් නිර්මාණය

කිරීම ඇසුරින් තත් ප්‍රවේශයන් වෙත එළඹිය හැකිය. ඵලදායි අන්තර්කරණයක් නිර්මාණය වන්නේ එවිටය. ඒ සඳහා පාසල් ප්‍රජාවට සුවිශේෂ වූ වගකීමක් ඇත. සෑම සිසුවෙකුටම නිර්මාණය කර ඇති සහ තෝරාගත් අධ්‍යාපන පසුබිම තුළ සමවයසේ මිතුරන් සමඟ බෙදා ගන්නා ඉගෙනුම් පරිසරයට පූර්ණ ලෙස සහභාගී වීමට පොදුවේ සෑම ශිෂ්‍යයකුටම අවස්ථාව උදාකර දිය යුතුය. පාසල් ප්‍රජාව හා සම්බන්ධ වන බාහිර සමාජය ද දැනුවත් කිරීම බෙහෙවින් වැදගත්ය. පාසල් පරිසරයේ පමණක් ඵලදායි පොදු ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීමෙන් අන්තර්කරණ අරමුණු සඵල කරගත නොහැකිය. ඒ සඳහා සමාජීය ප්‍රජාව ද සම්බන්ධ කර ගත යුතුය. සක්‍රීය අන්තර්කරණ ප්‍රවේශයන් සහ සන්නිවේදනය ඒ සඳහා උපයෝගී වේ. ඵලදායි පොදු ඉගෙනුම් පරිසරයක් ඇසුරින් යොමුවිය හැකි තත්ත්ව ප්‍රවේශයන් ලෙස,

ධනාත්මක වාතාවරණයක් සැපයීම

අයිතිවාසිකම් පිළිබඳ හැඟීම් ප්‍රවර්ධනය කිරීම

සුදුසු පුද්ගලික, සමාජීය, චිත්තවේගීය හා අධ්‍යයන අරමුණු කරා සිසුන්ගේ ප්‍රගතිය සහතික කිරීම

ස්වයං ඉගෙනුමට ප්‍රමාණවත් මට්ටමේ සහාය ලබාදීම

ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීම් පිළිවෙත් හා මූලධර්ම අනුගමනය කිරීමෙන් පුද්ගල ඉගෙනුම් අවශ්‍යතාවයන් ඉටු කිරීම

ඉගෙනීමේ හැකියාව ඇති සිසුන් සහ ප්‍රජා පාසලේ සමවයසේ මිතුරන් සමග අත්දැකීම් බෙදා ගැනීමට උපදෙස් ලබා දීම.

ඉගෙනගන්නෙකු ලෙස ඔවුන්ගේ පුද්ගලික අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දක්වමින් සිසුන් බහුතරයක් දෛනිකව වැඩිකාලයක් පොදු ඉගෙනුම් ක්‍රියාකාරකම්වල යෙදවීම

සෑම පාසලකම ප්‍රදේශයට ගැලපෙන පරිදි අන්තර්කරණ අධ්‍යාපන දියුණු කිරීම

දරුවන් සඳහා විධිමත් පාසල් අධ්‍යාපනයට ප්‍රවේශය නොමැති අවස්ථාවල අවිධිමත් ඕනෑම වර්ගයක අධ්‍යාපන කටයුතු ඇසුරින් විකල්ප අධ්‍යාපනය අවස්ථා උදාකර දීම



සම්පත් මධ්‍යස්ථානවල සහ විශේෂ පාසල්වල කාර්යභාරය පුළුල් කිරීම

අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ ගුරුවරුන් දැනුවත් කිරීම

විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සාමාන්‍ය පංතිකාමරයේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කිරීම අනෙක් දරුවන්ට බාධාවක් වන බව විදුහල්පතිවරු සහ සාමාන්‍ය පන්තිකාමර ගුරුවරු බොහෝ දෙනෙක් පිළිගනිති. අනවබෝධය හා නොදැනුවත්කම ඊට හේතුවයි. අධ්‍යාපන පද්ධතියේ ක්‍රියාකාරීව සම්බන්ධ වන පිරිස තුළ අන්තර්කරණය පිළිබඳ උද්යෝගිමත් සිතුවිලි, ධනාත්මක හා ප්‍රතිජනනාත්මක ආකල්ප ගොඩනැඟිය යුතුය.

## සමාලෝචනය

විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සාමාන්‍ය පන්තිකාමරයට ඇතුළත් කිරීම පිළිබඳ ගෝලීයව නව අධ්‍යාපන ප්‍රවණතාවක් හෙවත් ප්‍රවේශයක් තිබුණ ද ලාංකික අධ්‍යාපන පද්ධතියේ එය තවමත් ප්‍රාරම්භ අවධියේ පවතී. සාමාන්‍ය පුරවැසියන් තුළ පමණක් නොව අධ්‍යාපන පද්ධතියේ සේවයේ නියුතු පිරිස් ද එම දරුවන් වෙන් කර තැබීමට පෙලඹෙයි. අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ සමාජ දැනුවත්භාවය තවතවත් පුළුල් කර, ඵලදායි අන්තර්කරණ පරිසරයක් ගොඩනැගීම අවශ්‍යතාව වේ. වර්තමාන ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක වන ආකාරය, පාර්ශ්වකරුවන් මුහුණදෙන ගැටලු සහ අභියෝග සහ ඵලදායි අන්තර්කරණ පරිසරයක් ගොඩනැගීමෙහිලා විසඳුම් සහ යෝජනා පිළිබඳව දේශීයව සිදු කළ පර්යේෂණයන් සීමිත ප්‍රමාණයක් දක්නට ලැබේ. ගෝලීය සන්දර්භය තුළ සකස් කළ ප්‍රතිපත්ති, ප්‍රකාශන සහ සම්මුති මෙන්ම අන්තර්කරණයේ සාර්ථකත්වය කරා යොමු වූ රටවල් කෙරෙහි අවධානය යොමු කිරීම මෙරට තුළ ඵලදායි අන්තර්කරණයක් ගොඩනැගීමට හේතු වන බව නිගමනය කළ හැකිය.

## ආන්තික සටහන්

චක්‍රලේඛ අංකය - **2020/37**. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති හා විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා පහසුකම් සැලසීම ඇතුලු සියලුම ළමයි සඳහා අන්තර්කරණ අධ්‍යාපනය ලබාදීම පිළිබඳ චක්‍රලේඛය හා උපදෙස් සංග්‍රහය. අධ්‍යාපන අමාත්‍යාංශය.

**ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා**. (1979). රජයේ මුද්‍රණාලය.

**ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා යෝජනා**, (2016). නුගේගොඩ: ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව.

**ළමා මිතුරු ප්‍රවේශය පිළිබඳ උපදෙස් සංග්‍රහය**. (n.d.). බත්තරමුල්ල: ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව - අධ්‍යාපන අමාත්‍යාංශය,

අතුකෝරාල, දයා රෝහණ. (2016). **තුලනාත්මක අධ්‍යාපනය සහ රට රටවල අධ්‍යාපනය**. පානදුර: ශික්ෂා මන්දිර ප්‍රකාශන.

අබේපාල, රෝලන්ඩ්. (2010). **අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම**. කොට්ටාව: සාර ප්‍රකාශන.

සුනිල්, එස්.ටී. (2019). **විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය** කොට්ටාව: සාර ප්‍රකාශන.

සුනිල්, එස්.ටී. (2003). **"විශේෂ අධ්‍යාපනයේ නව ප්‍රවණතා (අන්තර්කරණ අධ්‍යාපනය)"**. ගුරු අධ්‍යාපන 2 කලාපය, (සංස්.) ඒ.එස්.එම්. දොඩන්තැන්න. මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය.

McManis, Lilla Dale. **Inclusive education**. https://resilienteducator.com 2021 11-05.

**Special Education**. https://www.britannica.com 2021 11-16.